අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
கல்விப் பீடம், கொழும்புப் பல்கலைக்கழகம்
**Faculty of Education, University of Colombo**

---

2025.03.20

**පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අර්ධ කාලීන) සිංහල මාධ්‍ය පාඨමාලාව 2025/2026**

ගරු ස්වාමීන්වහන්ස/ මහත්මයාණෙනි/ මහත්මියනි/ මෙනෙවියනි,

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අර්ධ කාලීන) සිංහල මාධ්‍ය පාඨමාලාවට තෝරා ගැනීම සඳහා පවත්වන ලද ලිඛිත පරීක්ෂණයෙන් අපේක්ෂිත ලකුණු මට්ටම සපුරා ඇති අපේක්ෂකයින්ගේ නාම ලේඛණය මෙහි දක්වා ඇත. මෙම ප්‍රතිඵලය 2025/2026 අධ්‍යයන වර්ෂයේ පාඨමාලාවට තෝරාගැනීම සඳහා පමණක් අදාළ වන බව ද සැලකිය යුතුය.

උක්ත පාඨමාලාවේ සම්මුඛ පරීක්ෂණය සහ ඔබගේ සහතික පත්‍ර පරීක්ෂා කිරීම 2025 මාර්තු 29 සහ 30 දෙදින පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේදී පැවැත්වෙන අතර, එයට පෙනී සිටින ලෙස ඔබට මෙයින් දන්වමි. **සම්මුඛ පරීක්ෂණයට පැමිණීම හා පාඨමාලාව හැදෑරීම කරන්නේ ද යන්න 2025.03.25 දිනට පෙර, පෙ.ව. 9.30-ප.ව. 3.00 අතර 0112559640 දුරකථන අංකයට ඇමතුමක් ලබාදී තහවුරු කළ යුතුය.** එසේ තහවුරු කරන ලද අයගේ නාම ලේඛණය, සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන වේලාව හා අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පිළිබඳ විස්තරය 2025.03.27 දින අධ්‍යාපන පීඨ වෙබ් පිටුවේ පළකරනු ඇත.

සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට පහත සඳහන් ලියකියවිලි, සහතික පත්‍ර සහ **ඒවායේ ඡායා පිටපත් රැගෙන පැමිණීම අත්‍යවශ්‍ය** බව සලකන්න. එම ලිපි ලේඛනවල අඩුපාඩු සහිත අපේක්ෂකයින් සියලු ලිපි ලේඛන ලබාදුන් පසු පාඨමාලාව සඳහා තෝරා ගනු ඇත.

1. ඔබගේ ජාතික හැඳුනුම්පත හා එහි ඡායා පිටපත.

2. ඔබගේ උප්පැන්න සහතිකය සහ එහි ඡායා පිටපත
(ඔබ දැනට භාවිත කරන නම උප්පැන්න සහතිකයේ සඳහන් නමට වෙනස් නම්, භාවිතා කරන නම නිවැරදි බව සනාථ කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු වේ.)

3. ඔබගේ උපාධි සහතිකය සහ එහි ඡායා පිටපත.
(එය විස්තරාත්මක විෂය අඩංගු පිටපත නොව උපාධි ප්‍රදානෝත්සවයේ ලබා දී ඇති මුල් සහතිකය විය යුතුය. තාවකාලික සහතික පත්‍ර භාර ගනු නොලැබේ.)

4. පාඨමාලාව හැදෑරීම සඳහා ඔබට අවසර හා පහසුකම් ලබා දෙන බව සඳහන් කරමින් විදුහල්පතිගේ හෝ අදාළ ආයතන ප්‍රධානියාගේ ලිපිය.
(මෙම අවසරය ඔබගේ කලාප අධ්‍යක්ෂගේ ද අනුමැතිය ද සහිතව ලැබෙන්නේ නම්, ඔබට අදාළ නිවාඩු ලබා ගැනීම ආදී කාර්යන් වඩාත් විධිමත් වනු ඇත.)

5. 2025.02.10 දින වන විට ඔබ රජයේ හෝ පුද්ගලික පාසලක පිරිවෙනක හෝ අධ්‍යාපන හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් ආයතනයක සේවයේ නියුතුව සිටි බව තහවුරු කෙරෙන ලිපියක්.


94, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03, ශ්‍රී ලංකාව
94, குமாரதுங்கமுனிதாசமாவத்தை, கொழும்பு 03, இலங்கை
94, CumaratungaMunidasaMawatha, Colombo 03, Sri Lanka

Telephone :0112588812
Fax : 0112596888
Email: dean@edu.cmb.ac.lk, sar@edu.cmb.ac.lk

| Department: | Edu. Psychology | Science & TechnologyEdu. | Humanities Edu. | Social Science Edu. |
|---|---|---|---|---|
| Telephone: | 0112504734 | 0112503147 | 0112586516 | 0112596887 |
| Email: | head@edpsy.cmb.ac.lk | head@dste.cmb.ac.lk | head@humed.cmb.ac.lk | head@sse.cmb.ac.lk |

පාඨමාලාවට ඔබ තෝරා ගතහොත් පාඨමාලාවට ලියාපදිංචි වීම සඳහා පුස්තකාල ගාස්තුව ද ඇතුළත්ව සම්පුර්ණ පාඨමාලා ගාස්තුව වන රු.135,000/-ක් **2025.04.10 දින හෝ ඉන් පෙර** අනිවාර්යයෙන්ම ගෙවිය යුතු වේ. එම මුදල මොනයම් හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ. පාඨමාලා ගාස්තුව අදාළ දින හෝ ඊට පෙර ගෙවීමේ හැකියාව පිළිබඳව සම්මුඛ පරීක්ෂණ දිනයේදී ම දැන්වීමට ඔබට හැකියාවක් අත්නම් එය අපගේ ඉදිරි කටයුතුවලට පහසුවකි.

මෙම පාඨමාලාව 2025 මැයි මස ආරම්භයේ දී ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. සති අන්තවලට අමතරව ඇතැම් විට රජයේ නිවාඩු දිනවල දී ද දේශන පැවැත්වෙන බව සලකන්න. සම්පූර්ණ පාඨමාලා කාලය මාස 18 කින් පමණ අවසන් කිරීමට අපේක්ෂිතය.

පාඨමාලාව සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු කෙරෙහි ද අවධානය යොමු කරනු කැමැත්තෙමි.

1. පාඨමාලා ගාස්තුවෙන් අඩක් පලාත් අධ්‍යාපන/ අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ගෙවනු ලබන අතර එය ලබා ගැනීම සඳහා අවසාන විභාගය සමත් වීමෙන් පසු ඔබ විසින් කටයුතු සංවිධානය කර ගත යුතුය.

2. පාඨමාලාව හදාරන අයට දේශන පැවැත්වෙන සති අන්තවල සඳුදා හෝ සිකුරාදා හෝ දිනය නිවාඩු ලබා ගත හැකි වන අතර එය ඔබගේ ආයතන ප්‍රධානියාගෙන් ලබා ගැනීම ඔබට පැවරෙන වගකීමකි.

3. පාඨමාලාවේ අවසන් පරීක්ෂණවලට පෙනී සිටීම සඳහා 80% ක පැමිණීම අනිවාර්ය වේ. ඔබට වෛද්‍යමය හේතූන් ද ඇතුළත් කුමන හේතුවක් නිසා හෝ 80% ක පැමිණීම පවත්වා ගත යුතු ය.

4. විධිමත් පාසලක, අධ්‍යාපන පීඨයේ අධීක්ෂණය යටතේ සතියකට පැය අටක් බැගින් සති 10 ක් තුළ ගුරු පුහුණුවෙහි යෙදීම පාඨමාලාවේ අනිවාර්ය අංගයකි. ඒ සඳහා අදාළ පහසුකම් ලබාගෙන ඉගැන්වීමේ කටයුතු සංවිධානය කර ගැනීම ඔබට පැවරෙන වගකීමකි.

ඉහත සඳහන් තත්ත්වයන්ට අනුව පාඨමාලාව තුළ කටයුතු කිරීමට නොහැකි නම්, සම්මුඛ පරීක්ෂණය සඳහා ද ඔබ නොපැමිණ, ප්‍රමුඛතාව අනුව වෙනත් අයෙකුට පාඨමාලාව හැදෑරීමට අවස්ථාව දෙන්න. සම්මුඛ පරීක්ෂණය සඳහා ඔබ එදින නො පැමිණෙන්නේ නම්, ඔබ වෙනුවට අප වෙනත් අයෙකු පාඨමාලාව සඳහා කඩිනමින් තෝරා ගනු ඇත.



ආචාර්ය එල් එම් කපිල බණ්ඩාර
පීඨාධිපති/ අධ්‍යාපන